**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2017/2018**

**PSC -1202 - ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය සහ දේශපාලනය පිළිබඳ පැතිකඩ**

**කාලය : පැය දෙකයි (02)**

ප්‍රශ්න **හතරකට ( 04 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **පහළොවකි (15).**

---

01. **එක්කෝ**

ඔබ බටහිර යටත්විජිතවාදයේ ගතිකයන් සඳහා ගත්තේ කෙසේ ද සහ ඒවා ආසියා, අප්‍රිකා සහ ලතින් ඇමෙරිකානු රටවලට කල බලපෑම් මොනවා ද? කෙටියෙන් විග්‍රහ කරන්න.

**නැතහොත්**

යටත්විජිතවාදය යනු කුමක්දැයි නිර්වචනය කොට සංඛ්‍යාත්මක බහුතරයට අවාසි වන ආකාරයෙන් යටත් විජිත ප්‍රතිපත්තීන් විසින් සුලුතර ජනයාට ලබා දෙන ලද සුවිශේෂ සැලකිලි ජනවාර්ගික ප්‍රශ්නයට හේතුවක් ලෙස හඳුනාගෙන ඇත්තේ කෙසේ දැයි සාකච්ඡා කරන්න.

02. (අ) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ වූ ව්‍යවස්ථායික සහ ආර්ථික ප්‍රතිසංස්කරණය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ආ) මෙම ප්‍රතිසංස්කරණ මෙරට සමාජ, සංස්කෘතික සහ දේශපාලන පරිනාමය කෙරෙහි බල පා ඇත්තේ කෙසේ ද?

03. පසුබිම ව්‍යුහය සහ එහි දේශපාලන බලපෑම යන කරුණු අවධානයට ලක් කරමින් සෝල්බරි ව්‍යවස්ථායික ආකෘතිය විවේචනාත්මකව විමසන්න.

04. **එක්කෝ**

මූලික වශයෙන් සම්භවය, ස්වභාවය සහ බලපෑම යන කරුණු ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්ව ක්‍රියාවලීන් තුලනාත්මකව විග්‍රහ කරන්න.

**නැතහොත්**

"1960 ගණන්වල ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ ප්‍රතිපත්තියේ මංසන්ධිමය අවස්ථාවක් වූ අතර එහිදී ශ්‍රී ලංකාව විවෘත ආර්ථිකයක සිට ආවෘත ආකෘතියකට මාරු වී ඉන්පසු සුභසාධන රාජ්‍යවාදයකට ප්‍රවේශ විය". මෙම ප්‍රකාශනය පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යුහය වෙස්ට්මින්ස්ටර් මොඩලයක සිට ජනාධිපති ක්‍රමයකට මාරු වූ ආකාරය සහ එම පරිවර්තනය මෙරට දේශපාලන ස්ථාවරත්වය සම්බන්ධයෙන් කෙසේ බලපා ඇත්දැයි යන්න කෙටියෙන් පහදන්න.

06. 1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ විධායක ජනාධිපතිත්වයේ බලය සහ ක්‍රියාකාරිත්වය විවේචනාත්මකව විමසන්න.

07. ලංකාවේ දේශපාලන පක්ෂ වල මෑතකාලීන ප්‍රවනතා සහ ගැටළු කෙටියෙන් විමසන්න.

08. පහත සඳහන් ඕනෑම **දෙකක් (02)** පිළිබඳව සටහන් ලියන්න.

(අ) " ජනරජය" යන්නෙහි තේරුම

(ආ) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය

(ඇ) බණ්ඩාරණායක චෙල්වනායගම් ගිවිසුම

(ඈ) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට එක් කළ 19 වන සංශෝධනය.

**********************